**මාර්ග සංවර්ධන අධිකාරිය - 2020**
**---------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 1,723 ක් වූ වාහන 426 ක් හා පිරිවැය රු.මිලියන 179 ක් වූ ගොඩනැගිලි 2020 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ අතර ඉන් වාහන 258ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේ වුවත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි. | වාහන 285 ක් 2021 වර්ෂයේ දී ප්‍රත්‍යාගණය කර ඇති අතර ඉතිරි වාහන ප්‍රත්‍යාගණය ආරම්භ වී ඇත. සියලු ම පළාත් ආවරණය වන පරිදි ගොඩනැගිලි තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇති නමුත්, කොවිඩ්-19 තත්ත්වය නිසා ප්‍රමාද වී ඇත. ක්‍රියාකාරි සැලැස්මට අනුව 2023 වන විට සියළුම ගොඩනැගිලි ප්‍රත්‍යාගණය කර ගිණුම්ගත කිරීමට නියමිතය. | අධිකාරියට අයත් සියලු වාහන, ගොඩනැගිලි ඇතුළු සියලු වත්කම් වර්තමාන සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශණවල නිරූපණය කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව මහාමාර්ග වැඩිදියුණු කිරීමේදි , පුළුල් කිරීමේදි සහ අධිවේගී මාර්ග ගොඩනැගීමේදි අත්පත් කරගෙන තිබූ රු.මිලියන 84,721 ක් වූ ඉඩම් පිළිබඳ වත්කම් ලේඛණයේ එම ඉඩම්වල වටිනාකම වෙන්ව දක්වා නොතිබුණි. මෙම ඉඩම් කැබලිවල හිමිකම් වලට | මේ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කරමින් පවතින අතර, ඉදිරියේදී අවශ්‍ය ගැලපුම් සිදු කෙරේ.<br>එමෙන්ම වත්කම් ලේඛනයේ එම ඉඩම්වල වටිනාකම, මාර්ග යටතේ වෙන් වෙන්ව සඳහන් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මහාමාර්ග වැඩිදියුණු කිරීමේදි,පුළුල් කිරීමේදී අත්පත් කරගත් ඉඩම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව වෙන්ව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාළ ලිඛිත සාක්ෂි අධිකාරිය සතුව නොතිබුණද, මෙම වටිනාකම තුල වූ රු.මිලියන 51,262 ක ඉඩම් මහාමාර්ග ක්ෂය කරනු ලබන අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණි. | | |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව හා ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මුලස්ථාන ගොඩනැගිල්ලේ මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ලබන වර්ග අඩි 72,400 ක ප්‍රමාණය සඳහා ආසන්න වශයෙන් ප්‍රාග්ධනිත වී ඇති රු.මිලියන 684.49 ක් හා ඊට අදාළ වාර්ෂික ක්ෂය රු.මිලියන 11.87 ක් සඳහා අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි. | භාවිත ගොඩනැගිලි වෙනුවෙන් කුලී ගෙවීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොමැති බව දැනුම් දී ඇත. රේඛීය සහ රාජ්‍ය අමාත්‍යාංශ භාවිතා කරන අනෙකුත් වත්කම් සමඟ මෙම ගොඩනැගිලි කොටස ද භාර දීමට කටයුතු කරමින් පවතී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව හා ගිණුම්කරණ ඒකක සංකල්පය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මුලස්ථාන ගොඩනැගිල්ලේ මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ලබන වර්ග අඩි 72,400 ක ප්‍රමාණය එම ආයතනවලට පැවරීම හා පොදුකාර්ය වියදම් අනුපාතිකව විභජනය කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන තෙලහපාත පොලීසිය වෙනුවෙන් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.මිලියන 80.8 ක් හා එකී ගොඩනැගිල්ලේ වාර්ෂික ක්ෂය රු.මිලියන 4.04 ක් අධිකාරියේ ගිණුම්වල දිගින් දිගටම නිරූපණය කරමින් තිබුණි. | අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය එම මාර්ග වල මෙහෙයුම් සඳහා සෘජුවම සම්බන්ධ වීමෙන් මාර්ගය භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහ පහසුව සලසයි. ඔවුන් බාහිර කටයුතු වලට සම්බන්ධ නොවන නිසා සහ රථ වාහන පාලනය තුළින් අධිකාරියට සෘජු ප්‍රතිලාභ ලැබෙන නිසා මෙම ගොඩනැගිල්ල අධිකාරියේ වත්කම් ලෙස සැලකීම ගිණුම්කරණ ප්‍රමිත වලට අදාළය. **මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශ ඉදිරි විගණන කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගනු ලැබේ.** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන තෙලහපාත පොලිසිය වෙනුවෙන් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පිරිවැය හා ක්ෂය මූල්‍ය ප්‍රකාශණ වලින් ඉවත්කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි නියමයන්ට පටහැනිව අධිකාරිය විසින් කල් පිරීමේ කාලය මාස තුනකට වඩා වැඩි වෙනත් ආයෝජන රු. මිලියන 1,940 ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබුණි. | විගණන ඡේදය හා එකඟ වේ. | කල් පිරීමේ කාලය මාස තුනකට වඩා වැඩි වෙනත් ආයෝජන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02ට අනුව හඳුනාගත යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව හා අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තියට අනුව, තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට අගය කරන බව දක්වා තිබුණද, අධිකාරිය විසින් තොගවල ශුද්ධ උපලබ්ධිත අගයට ගණනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ තොගය මත අගය කර මූල්‍ය | මාර්ග නඩත්තු කටයුතු වලට යොදා ගන්නා තොග ප්‍රථමයෙන් ලැබීම, ප්‍රථමයෙන් නිකුත් කිරීම යටතේ ගණනය කරයි. අතැති තොග සම්බන්ධයෙන් තොරතුරු කැඳවීමට කටයුතු කර ඇත. | අධිකාරිය තම අවසන් තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට අගය වාර්තාකල යුතුය. |

ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී මුල්වරට මාර්ග වත්කම් වලින් වෙන් කොට හඳුනාගෙන ගිණුම්ගත කරන ලද මහනුවර උමං මාර්ගයේ කඩ කාමර පිහිටි භූමිය සහ එහි වූ කඩ කාමර වල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 8.82 ක් සහ රු.මිලියන 84.66 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන සංචිත සේ දක්වා තිබූ නමුත්, එසේ සිදු කිරීමට අදාල ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කර නොතිබුණි. | එවකට භාවිතා කළ ගිණුම් ප්‍රතිපත්තිය අනුව උමං මාර්ග වල ඉදිකිරීම් පිරිවැය වියදම් ලෙස කපා හැරිය යුතුය. එමෙන්ම දැනට භාවිත ක්ෂය ප්‍රතිපත්ති අනුව ක්ෂය කලේ නම් ද ගොඩනැගිලි වල ශුද්ධ අගය මේ වන විට ශුන්‍ය වේ. ඒ අනුව, තක්සේරු වටිනාකම ප්‍රත්‍යාගනණ අතිරික්ත සේ සංචිත ගිණුමට මාරු කර ඇත. ගිණුම් ප්‍රතිපත්ති හා ගැලපුම් ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. | අදාල ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කල යුතුව තිබුණි. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය විෂය පථයට පරිභාහිරව දේශීය බැංකු අරමුදල් හා ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති ඒකකය මඟින් ක්‍රියාත්මක කරන ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දී අර්ධ වශයෙන් නිමකළ ජාතික මහා මාර්ග වලට අයත් නොවන මාර්ග වෙනුවෙන් රු.මිලියන 11,242 ක් වත්කම් වශයෙන් හඳුනාගෙන තිබූ අතර, ඒවා පූර්ණ වශයෙන් නිමකිරීමෙන් අනතුරුව වියදම් සේ ලියාහරින බව පමණක් මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් වලින් හෙළිදරව් කර තිබුණි. කෙසේ නමුත් මෙකී මාර්ග අදාළ පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට භාරදීමෙන් අනතුරුව ඊට සමගාමීව සිදු කළ යුතු ගැලපීම්වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියද ඇතුළු විස්තරාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | - එම - | අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියද ඇතුළු විස්තරාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කල යුතුව තිබුණි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් A සහ B ශ්‍රේණිවලට | මාර්ග ප්‍රාග්ධනිත කිරීම සම්බන්ධයෙන් පිහිටුවා | අධිකාරියට අයත් සියලු |

| | | | |
|---|---|---|---|
| | අදාල මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග 105 කට අයත් කිලෝමීටර් 2,237 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු කිලෝමීටර් 9,988 ක දුර ප්‍රමාණය වූ A සහ B ශ්‍රේණිවලට අදාල මහා මාර්ග වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් බැහැර වී තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග අංශ සහයක ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ පිරිවැය රු.මිලියන 37,040 ක් වූ කිලෝමීටර් 627.78 ක මාර්ග ප්‍රාග්ධනිත කිරීමට ද කටයුතු කර නොතිබුණි. | ඇති විශේෂ කමිටු 02 ක් සහ TCAM ව්‍යාපෘතිය මගින් හඳුන්වා දීමට නියමිත ක්‍රමවේදයක් 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2021 – 2023 වර්ෂ තුළ දී මාර්ග, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීම සඳහා සකස් කළ ක්‍රියාකාරි සැලැස්මට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | මහා මාර්ග නියමිත සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශණවල නිරූපණය කල යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තියට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 349.19 ක වත්කම් හානිකරණය සඳහා ලාභයෙන් වෙන්කර තිබුණ ද, හානිකරණය වූ වත්කම් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු වත්කම් වල සාධාරණ අගය ඉහත ප්‍රමානයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | DBST ක්‍රියාවලිය අඩපණ වීම මත භාවිතයට නොගත් Aggregate & Chip Spreader යන්ත්‍ර 11 ට අදාළ මෙම වෙන් කිරීම් කර ඇත. මෙම වත්කම් වල වර්තමාන වටිනාකම කමිටුවක් මඟින් තක්සේරු කර මුදල් අංශයට ඉදිරිපත් කර ඇත. අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කරනු ලැබේ. | හානිකරණය වූ වත්කම් නිශ්චිතව හඳුනාගෙන එම වත්කම්වලට එරෙහිව අදාල ගැලපුම් කල යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියට පිටත වටරවුම් පාර අදියර II ව්‍යාපෘතියෙන් පවරා තිබුණු අක්කර 11 ක් වූ ඉඩම් කැබලි 07 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබිලි 07 න් 03 ක මේ වන විට ප්‍රතිස්ථාපනය කිරීම් කර ඇත. ඉතිරි ඉඩම් පිළිබඳ තොරතුරු ලද පසු අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කෙරේ. | අදාල ඉඩම් තක්සේරුකර කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබූ පිරිවැය රු.මිලියන 6.86 ක් වූ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 03 ක් අධිකාරියේ ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි. | විගණන ඡේදය හා එකඟ වේ. | අදාල වත්කම් අදාල කාලපරිච්ඡේදය තුල දීම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කල යුතුය. |
| (ඉ) | හදිසි අනතුරු නිසා අධිවේගී මාර්ග වලට සිදු වූ හානි වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.මිලියන 4.6 ක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | කොවිඩ්-19 හේතුවෙන් තොරතුරු නිසි වේලාවට ගෙන්වා ගත නොහැකි වීම නිසා ගිණුම් ගත කිරීමට නොහැකි විය. | අත්හැරීම් දෝෂ අවමකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2006 සිට 2017 වර්ෂ වල දී විවිධ විදේශාධාර ව්‍යාපෘති වලින් සහ වෙනත් ක්‍රම යටතේ ලද රු.මිලියන 1,304.17 ක් වටිනා දුර්වල පාලම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන පරිගණක තොරතුරු පද්ධතිය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ වලට ඇතුළත් කර නොතිබුණි. | මේ සඳහා නිසි ක්‍රමවේදයක් සැකසෙමින් පවති. | අත්හැරීම් දෝෂ අවමකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (උ) | 2020 වර්ෂයේදී වසා දමන ලද පාදෙනිය - අනුරාධපුර මාර්ග ව්‍යාපෘතිය, රාජගිරිය පොල්ගහවෙල සහ ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ප්‍රාදේශිය පාලම් ව්‍යාපෘතිය අදියර II යන ව්‍යාපෘති වලින් අධිකාරිය වෙත පවරා තිබූ පිළිවෙලින් රු. මිලියන 9.6 ක් රු.මිලියන 27 ක් සහ රු.මිලියන 9.9 ක් ලෙස එකතුව රු.මිලියන 46.5 ක් වූ ජංගම වගකීම්, අධිකාරිය විසින් තම ගිණුම් වල ගලපා නොතිබුණි. | අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී සිදු කෙරේ. | අත්හැරීම් දෝෂ අවමකර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මිලියන) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මිලියන) | වෙනස (රු.මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල දැක්වෙන ගොඩනැගිලි සහ වාහන සඳහා ක්ෂය වෙන්කිරීම් ආරම්භක ශේෂය, වර්ෂය සඳහා ක්ෂය හා වර්ෂ අවසාන ක්ෂය වෙන්කිරීම් යන ශේෂයන් හා ඊට අදාල වත්කම් ලේඛනයේ ශේෂයන් අතර පිළිවෙලින් රු.මිලියන 72.65 ක සහ රු.මිලියන 77 ක වෙනසක් නිරීක්ෂණය විය. | 8,640.043 | 8,490.393 | 149.65 | විගණන ඡේදය හා එකඟ වේ. | මෙවැනි ආකාරයේ දෝෂයන් යලි ඇති නොවීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) | අධිකාරියේ 2020 දෙසැම්බර් 31 මූල්‍ය ප්‍රකාශන වල ව්‍යාපෘති වැටුප් පාලන ගිණුම සහ පොදුකාර්ය පාලන ගිණුම් අනුව ලැබිය යුතු ශේෂය හා එක් එක් ව්‍යාපෘතියට අදාළව අධිකාරිය වෙත ගෙවිය | 24,255,888 | 10,492,350 | 13.76 | අදාළ ගිණුම් සටහන් ව්‍යාපෘති ගිණුම් වල නිසි කාල පරිච්ඡේදය තුළ ගිණුම්ගත කිරීම හා අධිකාරියේ ගිණුම් ඌණ / අධි ගණනය | අධිකාරියේ හා ව්‍යාපෘති ගිණුම් කාලීනව සැසඳුම් කල යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යුතු ලෙස දක්වා තිබූ වැටුප් සහ පොදුකාර්ය වියදම් ශේෂයන්ගේ රු.මිලියන 13.76 ක වෙනසක් විය. එසේ වුවත් මෙම වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | | | | වීම මීට හේතු වී ඇත. | |
| (ඇ) | ජංගම වත්කම් හා වගකීම්වලට අදාල ගැලපීම් නියමිත පරිදි සිදු නොකිරීම නිසා මාර්ග සංවර්ධන අධිකාරියේ සහ සී/ස මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම් අතර වූ ජංගම ගිණුම් අතර රු.මිලියන 970 ක ශුද්ධ වෙනසක් පැවතුනි. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය සහ සී/ස මහ නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ (පුද්) සමාගම අතර වූ ජංගම ගිණුම් අතරද එකතුව රු.මිලියන 18.29 ක වෙනසක් නිරීක්ෂණය විය. | 6,110.08 | 5,121.79 | 988.29 | මාර්ග සංවර්ධන අධිකාරියේ සහ සී/ස මහනැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගමේ ජංගම ගිණුම් අතර කරන ලද සැසඳුම් වාර්තාව හා සී/ස මහ නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ (පුද්) සමාගම අතර රු. මිලියන 10.3 කට අදාලව සැසඳීම් වාර්තාවක් පිළියෙලකර විගණනයට ඉදිරිපත් කර ඇත. | අධිකාරියේ පරිපාලිත සමාගම් අතර ශේෂ සැසඳුම් කාලීනව සිදුකල යුතුය. |

### 1.5.5 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම්වල පිරිවැය සඳහන් නොවූ මෝටර් වාහන 53 ක් පැවති නමුත් මෙම මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ්-19 වෛරසය හේතුවෙන් වත්කම් ලේඛන නිරවුල් කිරීමට නොහැකි විය. ධාවන තත්ත්වයේ නොමැති වාහන විකිණීමට හෝ විනාශ කිරීමට අගුලාන වැඩ අංශයේ ගාල් කර ඇත. අනෙකුත් වාහන මේ වසරේ දී සත්‍යාපනය කරනු ලැබේ. | අධිකාරියේ සියලු වත්කම් සාධාරණ වටිනාකමට මූල්‍ය ප්‍රකාශණවල නිරූපණය කල යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා සිදුකර තිබූ ඉදිකිරීම් අධිකාරියේ වත්කම් වලට ගෙන රාජ්‍ය ප්‍රදාන ගිණුමට බැර කර තිබූ නමුත් එම මුදල් රාජ්‍ය ප්‍රදාන වටිනාකම හා පිරිවැය ගිණුම්ගත කිරීමට පදනම්වූ උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | 606,419 | අදාල වටිනාකම අධිකාරියට ප්‍රදානයක් ලෙස ගැනීම සඳහා අධිකාරිය ලබාදෙන ලිඛිත සාක්ෂි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් PED/E/RDA/3/111(i) හා 2021.05.07 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත. | අදාල වටිනාකම අධිකාරියට ප්‍රදානයක් ලෙස ගැනීම සඳහා අධිකාරිය ලබාදෙන ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කිරීම හා එම සාක්ෂි මත පිහිටා අදාල ප්‍රදාන ගිණුගත කිරීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සිදු වූ හදිසි අනතුරකින් අධිවේගී මාර්ගයට සිදු වූ අලාභය වූ රු.මිලියන 06 ක් ද ඇතුලුව අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු හා කළමනාකරණ අංශයේ හදිසි අනතුරු අලාභ රු.මිලියන 10.3 ක් අය වී නොතිබුණි. | සිදු වූ අනතුරු කිහිපයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත. | අදාල අයවිය යුතු මුදල් වහාම අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම සහ අනතුරකින් අධිවේගී මාර්ගයට සිදු වූ අලාභය ඇස්තමේන්තු ක්‍රියාදාමය විධිමත් කිරීමට සම්මතයන් හඳුන්වා දීම. |
| (ආ) | අධිකාරිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් යටතේ වූ රු.මිලියන 16,128 ක වටිනාකම තුල දකුණු පළාතෙහි සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් රු.මිලියන 1,073 ක් අයවීමට තිබුණි. | අය වීමට ඇති ශේෂයන් කිහිපයක් සම්බන්ධයෙන් සැසඳීම් කරමින් පවතින අතර තවත් ශේෂයන් කිහිපයක් පියවීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇත. ආයෝජන මණ්ඩලයේ ශේෂය සම්බන්ධයෙන් මේ වන තෙක් මුදල් ලැබී නොමැත. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් වූ සේවාදායක තැන්පතු ශේෂය රු.මිලියන 3,334.9 ක් විය. මෙකී ශේෂය තුළ වූ වසර 2 -4 අතර නිරවුල් නොවී පවතින ශේෂය රු.මිලියන 1,735.26 ක් වූ අතර මෙයින් සියයට 62 කට සමාන රු.මිලියන 1,075.45 ක් බස්නාහිර පළාත් කාර්යාල වල නිරවුල් නොවී පවතින ශේෂයන් විය. | නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලැබේ. | සේවාදායක තැන්පතු තුළ කෙරීගෙන යන ශේෂ පමණක් ඉතිරිවන ලෙස සෙසු ශේෂයන් ආදායමට ගත යුතුය. |

**1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරියේ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු යටතේ සී/ස මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගම වෙත ගෙවිය යුතු රු.මිලියන 5.14 ක මුදලින් රඳවාගත් මුදල් ලෙස රු. මිලියන 2.4 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුනි. | මේ සඳහා පත් කළ කමිටුවේ නිර්දේශයන් මත නැවත ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. | අදාල මුදල්, ශේෂ තහවුරු කරගැනීමෙන් නිරවුල් කිරීමට හෝ සුදුසු ගිණුකරණ ක්‍රියාමාර්ගයක් ගැනීම සිදු කළ යුතුය. |
| (ආ) | සී/ස මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමේ ව්‍යාපෘති වලට අදාළ ගෙවිය යුතු රඳවුම් මුදල වන රු.මිලියන 16.22 ක මුදලින් රු.මිලියන 12.24 ක් එනම්, සියයට 75.5 ක් වසර 07 කට වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුනි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | අදාල මුදල් ශේෂ තහවුරු කරගැනීමෙන් අනතුරුව පියවා දැමීමට කටයුතු කළ යුතුය. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: | | | |
| (i) මු.රෙ 201 | පුද්ගල පඩිනඩි සම්බන්ධයෙන් නව බදවා ගැනීම් සම්බන්ධයෙන් අනුමත වැටුප් බලය දීමේ, අනුමත කිරීමේ, අනුමත වැටුප් කේතයන්ට අනුකූලව පරිමාණයක් ඉක්මවා, | | |

| | | | |
|---|---|---|---|
| | සහතික කිරීමේ හා ගෙවීම් කිරීමේ නිලධාරීන් විසින් මෙම රෙගුලාසි වලින් බැහැරව අනුමත වැටුප් පරිමාණයක් ඉක්මවා, වැරදි වැටුප් කේත මත වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අභ්‍යන්තර උසස්වීම් ලබා දීම හා අදාල වැටුප් කේත / පියවරයන් ලබා දීම දැනටමත් සිදු කරනු ලැබේ.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව දැනට අනුමත කර ඇති සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ වලට අනුකූලව පිරවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.<br><br>එමෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප්/ වැටුප් කේතයන්, තනතුරට අදාළ මූලික සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් වලින් තොර උසස්වීම් ලබාදීම අත්හිටුවීමට කටයුතු කර ඇත. | වැරදි වැටුප් කේත මත වැටුප් හා දීමනා නොගෙවිය යුතුය.<br><br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ වලට අනුකූලව පමණක් පුරප්පාඩු පිරවීමට ක්‍රියාකල යුතුය. |
| (ii) මු.රෙ.762 | ප්‍රශස්ථ තොග කළමනාකරණයක් පවත්වා නොගැනිම නිසා වසර 05 කට වඩා වැඩි කාලයක් පැරණි, පිරිවැය රු.මිලියන 2.6 ක තොග ශේෂයක් නිශ්කාර්යව තිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් කාර්යාල වලින් තොරතුරු කැඳවා ඇත. | ප්‍රශස්ථ තොග කළමනාකරණයක් පවත්වාගත යුතු අතර තොග සඳහා අනවශ්‍ය මුදල් ආයෝජනය නොකළ යුතුය. |
| (iii) මු.රෙ.763 | විශාල ප්‍රමාණයෙන් තොග තබා ගන්නා විට පවත්වාගෙන යා යුතු ගබඩා ව්‍යවස්ථා හා ක්‍රියාපටිපාටි අධිකාරිය විසින් සකස් කර නොතිබුණි. | අවශ්‍ය දැනුවත් කිරීම් කිරීමට චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබේ. | ගබඩා ව්‍යවස්ථා හා ක්‍රියාපටිපාටි අධිකාරිය විසින් සකස් කල යුතුය. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය: | | | |
| (i) 1 වගන්තිය | අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට, කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ii) 5 වගන්තිය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර | මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | කිරීම කල |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය: | | | |
| (i) 8.3.9 වගන්තිය | අධිකාරිය සතු රු.මිලියන 215.72 ක් වටිනා වාහන 70 ක් බාහිර ආයතන වෙත ලබා දී තිබුණි. එසේම අධිකාරියේ මූලස්ථාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 72,400 ක් මහා මාර්ග අමාත්‍යාංශයට භාවිතයට ලබා දී තිබුණි. එසේම වර්ග අඩි 72,400 කට අදාළ නඩත්තු වියදම් සහ උපයෝගීතා වියදම් ද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දරා තිබුණි. | RCDC ආයතනයට ලබා දී ඇති වාහන සම්බන්ධයෙන් තොරතුරු සොයමින් සිටින අතර අමාත්‍යාංශයට ලබා දී ඇති වාහන තාවකාලික අනුමැතියක් මත ලබාදී ඇත. මග නැගුම ආයතනයට කුලී ගිවිසුම් සහිතව වාහන ලබා දී ඇත. | අධිකාරිය සතු වාහන ඇතුලු වත්කම් මෙම චක්‍රලේඛය ප්‍රකාරව ලබාදීමෙන් වැලකිය යුතුය. |
| (ii) 9.12 වගන්තිය | සුබසාධන කටයුතු වෙනුවෙන් වැය දැරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සැපයීම සඳහා එකී අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉහළ කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීරණයක් ගැනීමට නියමිතය. | සුබසාධන කටයුතු වෙනුවෙන් වැය දැරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියක් ලබාගත යුතුය. |
| (ඈ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 සහ 2009 ජුනි 01 දිනැති අංක 30(I) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය: | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත් එකී නියමයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත උසස් වීම් ලබා දී අනුමත නොකරන ලද වැටුප් පරිමාණයන් මත නව තනතුරු සඳහා වැටුප් පියවර ලබා දී තිබුණි. මේ අනුව, අනුමත කළ වැටුප්තල ඉක්මවා ඉහළ වැටුප්තල ආදේශ කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ දී පමණක් අධිකාරිය වැඩි පුර ගෙවා තිබු වැටුප ආසන්න වශයෙන් රු.මිලියන 157 කි. | 2005 වසර දක්වා බඳවා ගැනීමේ පරිපාටිය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කර ඇත. නව බඳවා ගැනීමේ පරිපාටිය මෙතෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නැත. ඒ අනුව, සියලුම බඳවා ගැනීම් හා උසස් වීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් කේතයන් වලින් පරිබාහිර උසස් වීම් ලබා දීම අත්හිටුවා ඇත. | අධිකාරියේ බඳවාගැනීමේ පටිපාටිය කඩිනමින් අනුමත කරවා ගැනීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට පරිභාහිර ගෙවීම් නිවැරදි කිරීම හා වැඩිපුර ගෙවීම් සම්බන්ධව කටයුතුකල නිලධාරීන්ගෙන් අදාල මුදල් අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය: | | | |
| (i) | 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය, | අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස්කල යුතුය. |
| (ii) | 3.4.3 (අ) වගන්තිය, | දැන්වීම් පළ කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමකින් යුතු අයිතමයන් සහ නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිල දී ගැනීම සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමේදී නියමිත ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි. | කොවිඩ්-19 සහ පාස්කු ප්‍රහාරය වැනි දෑ නිසා සම්පූර්ණයෙන් ලියාපදිංචි කිරීමේ කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව වැඩි මිල ගණන් සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම සහ අඩු මිල ගණන් සඳහා මුද්‍රා තබන ලද මිල කැඳවීම් සිදු කරයි. | සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමේදී නියමිත ක්‍රමවේද අනුගමනය කළ යුතුය. |
| (iii) | 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය, | අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි. | වෙබ් අඩවිය නවීකරණය කිරීමෙන් පසුව තොරතුරු පල කිරීමට කටයුතු කෙරේ. ජාතික තරඟකාරී ප්‍රසම්පාදනයන් සඳහා තේරී පත් වූ කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර දැනටමත් වෙබ් අඩවියේ පල කරනු ලැබේ. අසාර්ථක ලංසුකරුවන් හඳුනා ගැනීම සඳහා දත්ත මූලාශ්‍රයන් පවත්වාගෙන ගෙන යෑම ආරම්භ කර ඇති අතර ඉදිරියේදී එවැනි ලංසුකරුවන්ගෙන් මිලදී ගැනීම් සිදු නොකිරීමට කටයුතු කරනු ලැබේ. කොන්ත්‍රාත් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ ආරක්ෂක බැඳුම්කර, මුදල් කර අධිකාරිය වෙත ලබා ගෙන අදාල කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කල යුතුය.<br><br>කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කළ යුතුය. |
| (iv) | 4.3.1 (අ), 5.3.3 සහ 7.8.4 (ඉ) යන වගන්ති, | අධිකාරිය විසින් 2020 වර්ෂයේදී සිදුකර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 463 ක් වූ | ඇස්තමේන්තු සඳහා මේ වන විට අනුමැතිය ලබා ගෙන ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි | ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විධිමත් මුළු පිරිවැය |

| | | | | |
|---|---|---|---|---|
| | | ටිපර් රථ සේවාව ලබා ගැනීම, කළු ගල් මිලදී ගැනීම, තාප සුවිකාර්ය ද්‍රව්‍ය මිලදී ගැනීම සහ බිටුමින්ස් ඉමල්ෂන් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විධිමත් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් නොකිරීම, ලංසු ලේඛන වල ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පුළුල් ලෙස විස්තර නොකිරීම සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වා නොමැති ලංසු ඇගයීමට ලක් කිරීම යනාදිය සිදුකර තිබුණි. | සඳහන් පරිදි ඉදිරියේ දී ලංසු ඇගයීමට ලක් කෙරේ. | ඇස්තමේන්තු සකස් කිරීමට, ලංසු ලේඛන වල ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පුළුල් ලෙස විස්තර කිරීමට සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වා නොමැති ලංසු ඇගයීමට ලක් නොකිරීමට කටයුතු කිරීම. |
| (v) | 5.4.10. (ආ) වගන්තිය | රු.මිලියන 251 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කාර්යසාධන සුරක්ෂණයන් නියමිත පරිදි ලබා ගෙන නොතිබු අතර, තවත් රු.මිලියන 100 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ප්‍රසම්පාදනයක් සම්බන්ධයෙන් අතාත්වික අනුප්‍රමාණ විශ්ලේෂණය කිරීම සහ ලංසුකරුවන්ගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂා කිරීමක් ද සිදු කර නොතිබුණි. | කාර්යසාධන සුරක්ෂණයන් නියමිත පරිදි ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන අතර, පැවති අඩුපාඩු හඳුනාගෙන සුදුසුකම් මනාව පරීක්ෂා කොට සුදුසුම කොන්ත්‍රාත්කරුව තෝරා ගැනීම කෙරෙහි ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | කාර්ය සාධන සුරක්ෂණයන් නියමිත පරිදි ලබා ගැනීමට, අතාත්වික අනුප්‍රමාණ විශ්ලේෂණය නොකිරීමට සහ ලංසුකරුවන්ගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂා කිරීමක් ද සිදු කළ යුතුය. |
| (vi) | 8.9.1 (ආ) වගන්තිය | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබීම හෝ ගිවිසුම් වලට එළඹීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. | කොවිඩ්-19 තත්ත්වය මත කාල ප්‍රමාදයන් සිදු වුවත් ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් වලට වහාම එළඹීමට කටයුතු කළ යුතුය. |
| (vii) | 8.8.1 (අ) වගන්තිය | අසාර්ථක වූ ලංසුකරුවන් වෙත එම ලංසු අසාර්ථක වීමට බලපාන හේතු ද සහිතව දැනුම්දිය යුතු වුවත් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එවැනි දැනුම් දීමක් සිදුකර නොතිබුණි. | වාචිකව පැහැදිලි කිරීම් සිදු කර ඇතත්, ලිඛිතව දැනුම් දීම ඉදිරියේදී සිදු කරනු ලැබේ. | අසාර්ථක වූ ලංසුකරුවන් වෙත එම ලංසු අසාර්ථක වීමට බලපාන හේතු ද සහිතව දැනුම්දිය යුතුය. |
| (ඊ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව එලෙස එකතුකරන ගාස්තු අධිකාරියේ අරමුදලට බැරකල යුතු | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් එකතු කරගත් රු.මිලියන 52,056 ක ආදායමෙන්, රු.මිලියන 15,000 කට ආසන්න මුදලක් එනම්, ආදායමෙන් සියයට 30 ක් පමණ ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාරයට ප්‍රේෂණ ලෙස ලබා දී තිබූ අතර ඉතිරි සියයට 70 ක් වූ මුදල අධිවේගී මාර්ග නඩත්තු කටයුතු වලට හා යථෝක්ත ගැසට් පත්‍රයේ | අධිවේගී මාර්ග වලින් එකතුකර ගත් ආදායමෙන් රු. මිලියන 1,500 ක් මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලංකා බැංකුවෙන් ලබා ගත් ණය මුදලේ ඇප තැන්පතු ලෙස තබා ඇත. භාණ්ඩාගාරයේ අය බදු ලෙස රු. මිලියන 4,000 ක් ලබා දී ඇත.<br><br>අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම මහා භාණ්ඩාගාරයේ | අධිවේගී මාර්ග ආදායම වියදම් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත ගැසට් පත්‍රයේ නියමයන් අනුව කටයුතු කල යුතුය.තවද පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරණ වියදම් අත්‍යාවශ්‍ය වර්තන වියදම්වලට සීමාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| අතර ගාස්තු අය කරන ජාතික මහා මාර්ග සංවර්ධනයට හා නඩත්තු සඳහා එම අරමුදල් භාවිතා කළ යුතුය. | නියමයන්ට පරිබාහිර වන අධිකාරියේ පොදු වියදම්,වැටුප් ගෙවීම් හා ව්‍යාපෘතිවලට ගෙවීම් සඳහා සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම සඳහා වැයකර තිබුණි. | අවසරය ඇතිව වැටුප් ගෙවීමේදී ඇති වන අරමුදල් ඌණතාවය සඳහා භාවිතා කරන ලදී. අධිවේගී මාර්ග වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වන වියදම් අධිවේගී මාර්ග ආදායමින් පියවා ගන්නා අතර පොලිස් කොට්ඨාශයේ රාජකාරි කටයුතු සෘජුවම අධිවේගී මාර්ගයේ මෙහෙයුම් කටයුත්තක් වන බැවින් එම වියදම ද අධිවේගී මාර්ග ආදායමින් දරා ඇත. | |
| (ඇ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත | | | |
| (i) 4(3) වගන්තිය | මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන්නා වූ "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කර නොතිබුණි. | කොවිඩ්-19 හේතුවෙන් මේ සම්බන්ධව කටයුතු කිරීමට අපහසු වී ඇත. දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු රැස්වීම් වල දී මෙම ක්‍රියාකාරී සැලැස්මෙන් සිදුවන කාර්යන්ට සමාන කාර්යක් ඉටු වේ. | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස්කල යුතුය. |
| (ii) 6(1) වගන්තිය | උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස්කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා නොතිබුණි. | කොවිඩ්-19 හේතුවෙන් මේ පිළිබඳව කටයුතු කිරීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවිය යුතුය. |
| (iii) 7(1) වගන්තිය | සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධන සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, මාර්ග සංවර්ධන සහ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය, මාර්ග සංවර්ධන ව්‍යාපෘති භාර දීම විධිමත් කිරීම හා ව්‍යාපෘති භාරගැනීම සම්බන්ධයෙන් | කොවිඩ්-19 හේතුවෙන් මේ සම්බන්ධව කටයුතු කිරීමට අපහසු වී ඇත. දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වල දී මාර්ග සංවර්ධනය හා නඩත්තු සම්බන්ධව වන කරුණු මාර්ග සංවර්ධන අධිකාරිය වාර්තා කරනු ලැබේ. | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටු විය යුතුය. |

අමාත්‍යවරයාට නිර්දේශ කිරීම සඳහා පිහිටවිය යුතු "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන178,839 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 139,909 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 38,930 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හුවමාරු නොවන ගනුදෙනුවලින් පැන නගින ලද රාජ්‍ය ප්‍රදාන අනුරූපී වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 61,496 කින් ඉහල යාම සංවර්ධන හා නඩත්තු වියදම් රු.මිලියන 5,264 කින් පහලයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | 2020 වර්ෂය | 2019 වර්ෂය | 2018 සාපේෂව ප්‍රතිශතක වෙනස |
|---|---|---|---|
| | (රු.මිලියන) | (රු. මිලියන) | |
| රාජ්‍ය ප්‍රදාන | 215,632 | 165,883 | 58 |
| පොළී ආදායම | 937 | 1,067 | (13) |
| සංවර්ධන හා නඩත්තු වියදම් | 10,257 | 15,142 | (32) |
| මූල්‍ය වියදම් | 13,727 | 14,721 | (07) |
| සේවක වැටුප් | 10,287 | 8,979 | 14 |
| දේපල පිරියත ක්ෂය | 39,769 | 29,582 | 34 |

- නිමකරන ලද මාර්ග ව්‍යාපෘති අධිකාරියට පැවරීමේදී එලෙස පවරන ලද වත්කම් වලට සමාන රාජ්‍ය ප්‍රදාන ආදායම් ඉතා සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති අතර, මූල්‍ය වෙළඳපලෙහි පොළී අනුපාත පහල යාම හේතුවෙන් ස්ථාවර තැන්පතු වැඩි වී පොලී අදායම අනුරූපී වර්ෂයට සාපේකෂව පහල ගොස් තිබුණි.

- අධිකාරියේ ක්‍රියාත්මක කරන ලද රන් මාවත් ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් වියදම් වශයෙන් ලියා හැරීම හේතුවෙන් සංවර්ධන හා නඩත්තු වියදම් ඉකුත් වර්ෂයේ දී ඉහළ ගොස් තිබූ අතර එය ප්‍රවර්ථන වර්ෂයේ දී එය සාමාන්‍ය තත්ත්වයට පත්ව තිබුණි.

- අධිකාරියේ ණය ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය වියදම් පෙර වසරට සාපේක්ෂව තව දුරටත් අඩු වී ඇති අතර අධිවේගී මාර්ග පද්ධතිය පුළුල් වීම නිසා නව සේවකයන් බඳවා ගැනීම හා අධිකාරියේ ඇති වී තිබූ පුරප්පාඩු සම්පූර්ණ කිරීම නිසා සේවක වැටුප් සඳහා වියදම පෙර වසරට සාපේෂව ඉහල ගොස් තිබුණි.

- අධිවේගී මාර්ග ව්‍යාපෘති නිමවී මාර්ග ඇතුළු වත්කම් අධිකාරියට පැවරීම නිසා වත්කම් පදනමේ සිදුවූ ප්‍රසාරණය දේපල පිරියත ක්ෂය ඉකුත් වර්ෂයට සාපේෂකව ඉහල යාම මීට හේතු වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| | 2020 | 2019 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2:1.44 | 2:1.23 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:1.42 | 1:1.21 |

ජංගම අනුපාතය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ජංගම අනුපාතයේ කිසියම් ධනාත්මක වැඩිවීමක් නිරූපනය වන අතර ක්ෂණික වත්කම් අනුපාතය ද අපේක්ෂිත අවම මට්ටම ළඟා වී තිබෙන අතර එයද පෙර වර්ෂ සමඟ වර්ධනයක් පෙන්නුම් කෙරේ.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගේ 8.12.1 (අ) අනුව අතුරු ගෙවීම් සහ අවසාන ගෙවීම් සිදු කිරීමේ කාර්ය සඳහා භාණ්ඩ සැපයීම හෝ සේවා සැලසීම ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 60 ක් වූ බිටුමින්ස් ඉමල්ෂන් මිලදී ගැනිමේ දී අධිකාරියට රු.මිලියන 1.3 ක මූල්‍ය අලාභයක් සිදුව තිබුණි. | මගනැගුම ඉමල්ෂන් සමාගමින් මෙම මිලදී ගැනීම සිදු කිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම සමාගම අධිකාරිය යටතේ වූ සමාගමක් නිසා වෙනත් පුද්ගලික සැපයුම්කරුවන්ගේ මිල ගණන් හා සැසදිය නොහැක. මෙහිදී අලාභයක් සිදු වී නොමැති අතර මාර්ග සංවර්ධන අධිකාරියේ මැෂින් පාවිච්චිය සඳහා අය කරනු ලබන මුදල් හා අධිකාරියේ profit margin අධිකාරිය වෙතටම ලැබෙන බැවින් මෙහිදී පාඩුවක් සිදු වී නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගේ පදනම වන ආර්ථිකමය බව හා මුදලට අගය පිළිබඳ අවධානය යොමුකොට ප්‍රසම්පාදනයන් සිදුකල යුතුය. |
| (ආ) | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ට අනුකූල නොවන ලෙස ලබාදී තිබූ සියයට 50 ක අත්තිකාරම් මුදලින් කොන්ත්‍රාත් වැඩ අවසන් නොවීම නිසා අයවිය යුතුව තිබූ ශේෂය රු. මිලියන 3.86 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විගණන ඡේදය හා එකඟ වේ. | අධිකාරියට අය විය යුතු මුදල් අයකර ගැනීමට හෝ පවරන ලද කාර්යය ඉටුකරවා ගැනීමට අධිකාරියේ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කල යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සී/ස සිලෝන් බිස්කට් සමාගම වෙත බදු දී තිබූ පර්චස් 81.8 ක මාර්ග රක්ෂිතයට අදාලව නියමිත පරිදි බදු මුදල් අය කර නොගැනීම සහ හිඟ බදු කපාහැරීම නිසා අධිකාරියට සිදුව තිබූ මූල්‍ය අලාභය රු.මිලියන 8.2 ක් විය. | වත්කම් කළමනාකරණ හා ආදායම් අංශයේ ශාස්තු කමිටුව විසින් හිඟ බදු මුදල් කපා හැරීම සඳහා කල නිර්දේශයන්ට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. කිසිදු ආදායමක් නොලද ඉඩමක් බදු දීම තුලින් අධිකාරියට මූල්‍ය වාසියක් ලැබී ඇත. | අධිකාරියට අයත් වත්කම් වලින් උපරිම ආර්ථික වාසි ගෙනදෙන පරිදි වත්කම් කළමණාකරණය කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අධිකාරිය විසින් මිලදී ගන්නා වත්කම් සම්බන්ධයෙන් ඇණවුම නිකුත් කරන අවස්ථාවේ සිට එම වත්කම් ඉවත්කරන අවස්ථාව දක්වාත්, ගොඩනගන වත්කම් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ වල සිට ප්‍රාග්ධනිත කිරීම දක්වාත් අවශ්‍ය කරන නියාමනයන් සිදුකිරීම පිණිස වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදනවලට පටහැනිව උතුරු අධිවේගී මාර්ගයේ, චීන මෙට්‍රොලොජිකල් සමාගමේ සිදුවී තිබූ වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 158,386 කට එම සමාගමට ප්‍රදානය කර තිබුණි. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය අරමුදල් සපයන ආයතනයක් නොමැතිව 2016 අගෝස්තු 18 දින අදාල සමාගම සමඟ ඉදිකිරීමේ ගිවිසුමකට එළඹී තිබුණි. තවද ගිවිසුමේ පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් චීන නීතියට අනුකූලවීම සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 02 දින නීතිපතිවරයා විසින් යෝජනා කර තිබූ සංශෝධනද එම ගිවිසුමට එළඹීමේ දී සමාගම විසින් පිළිගෙන නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෘත්තීය වන්දි රක්ෂණය සඳහා පැකේජ 1 සහ 2 යටතේ පිළිවෙලින් රු.මිලියන 5 ක් සහ රු.මිලියන 83 ක් වැඩ ප්‍රමාණන පත්‍රයට වෙනම වැඩ අයිතමයක් ලෙස ඇතුළත් කර තිබුණි. | අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම මධ්‍යම අධිවේගී මාර්ගය 1 කොටස ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව පිළිගත හැක.<br><br>මෙවැනි වියදමක් ප්‍රතිපූරණය කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරු ලිඛිතව ඉල්ලීමක් සිදුකර නොමැති අතර ඒ සඳහා ගිවිසුමක්ද තිබී නොමැත. ඒ අතරම මෙම ව්‍යාපෘතියේ හෝ වෙනත් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියක අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බැරකමක් ගිණුම් ගත වී නොමැත.<br><br>තවද කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෘත්තීය වන්දි රක්ෂණය සඳහා පැකේජ 1 සහ 2 යටතේ පිළිවෙලින් රු.මිලියන 5 ක් සහ රු.මිලියන 83 ක් වැඩ ප්‍රමාණන පත්‍රයට වෙනම වැඩ අයිතමයක් ලෙස ඇතුළත් කර තිබුණි යන ප්‍රකාශය නිවැරදි වේ. | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම හා අරමුදල් ලැබීම පිළිබඳ නිශ්චිතතාවයක් ඇතිකර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කල යුතුය.තවද සෑම විටම ව්‍යාපෘති ප්‍රදානයකදීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදනවලට අනුකූලව එය සිදුකිරීමට සහ ප්‍රමාන පත්‍ර සැකසීමේ දී උපරිම ආර්ථික වාසිය ප්‍රසම්පාදන අස්ථිත්වයට හිමිවන පරිදි ප්‍රමාන පත්‍ර සැකසීම. |
| (ඇ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ ii කොටස සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉටු කල යුතු රු.මිලියන 1,773 ක ජ්‍යාමිතික සැලසුම් සහ රු.මිලියන 805 ක් වූ කාර්යසාධන බැඳුම්කර පිරිවැය වෙනම වැඩ අයිතමයක් ලෙස වැඩ ප්‍රමාණන පත්‍රයට ඇතුළත් කර තිබුණි. එසේම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රු. මිලියන 30 ක දිරි දීමනා ගෙවා තිබුණද 2021 අගෝස්තු 10 දින වන විටත් එම කටයුතු අවසන් | කොන්ත්‍රාත්වල විශේෂිත කොන්දේසිවල උප වගන්ති අනුව ජ්‍යාමිතික සැලසුම හැර අනෙකුත් සියලුම සැලසුම් කොන්ත්‍රාත්කරු විසින් සිදු කර ගත යුතු වුවද, ඒ සඳහා රු.මිලියන 1,773 ක වෙනම වැඩ අයිතමයක් වැඩ ප්‍රමාණන පත්‍රයට ඇතුළත් කර තිබුණි යන ප්‍රකාශය හා එකඟ විය නොහැක. | ප්‍රමාන පත්‍ර සැකසීමේ දී උපරිම ආර්ථික වාසිය අස්ථිත්වයට හිමිවන පරිදි ප්‍රමාන පත්‍ර සැකසීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කොට වැඩබිම හැකි ඉක්මනින් නිශ්කාශනය කර දීම. |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ප්‍රදානය කරන ආයතනය සමඟ ගිවිසුමක් තිබිය යුතු නමුත්, එවැනි ගිවිසුමක් නොමැතිව වසර 05 කට ආසන්න කාලයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි. | නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රු. මිලියන 30 ක දිරි දීමනා ගෙවා තිබුණද 2021 අගෝස්තු 10 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි යන ප්‍රකාශය හා එකඟ වේ. | |
| (ඈ) | මධ්‍යම අධිවේගී මාර්ගය - III කොටසේ සිවිල් ඉදිකිරීම් කටයුතු කිසිවක් මේ දක්වා ආරම්භ කර නොතිබුණද, 2013 වර්ෂයේ පිහිටුවා තිබූ ව්‍යාපෘති මෙහෙයුම් ඒකක වෙනුවෙන් රු. මිලියන 834 ක් වැය කර තිබුණි. එසේම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කට මිලියන 32.3 ක දිරි දීමනා ගෙවා තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ඉතා මන්දගාමී තත්වයක පැවතුණි. ඒ අනුව ඉඩම් කට්ටි 3,264 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර එයින් ඉඩම් කට්ටි 2,556 ක් සඳහා වන්දි වශයෙන් රු. මිලියන 4,834 ක් හා ඒ සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 98 ක් ප්‍රමාද පොලී ගෙවා තිබුණි. නමුත් ඉඩම් කට්ටි කිසිවක් මේ දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර නොතිබුණි | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ III වන කොටසේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු 2014 දී සිට අවස්ථා කිහිපයකදී සිදු කළ නමුත් 2021 පෙර සිදු කරන ලද සියලු ප්‍රසම්පාදනයන් රජයේ තීරණ මත හෝ ණය ආධාර මුදල පිළිබඳ අවසන් එකඟතාවයකට පැමිණීමට නොහැකි වීම මත අතරමග නවතා දමන ලදී.<br><br>දේශපාලන වෙනස්වීම්, ඒ හේතුවෙන් අමාත්‍යවරුන්ගේ හා නිලධාරීන්ගේ වෙනස්වීම, මූල්‍ය ප්‍රතිපාදන සැලසුම්කල පරිදි නොලැබීම, හිමිකම් පරීක්ෂණ සඳහා විශ්‍රාමික පරිපාලන නිලධාරීන් වෙනුවට ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් යොදා ගැනීමේදී ඔවුන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් කටයුතු ප්‍රමාද වීම සහ 2020 වර්ෂයේ සිට කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ද කටයුතු තවත් ප්‍රමාද වීමකට ලක්විය.<br>මේ වන විට පොලී ගෙවා ඇති සියළු කැබලි සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කරනු ලැබ ඇති අතර, 2021.11.05 දිනට කැබලි 70 ක් පැවරීමේ කටයුතු අවසන් කර ව්‍යාපෘතිය වෙත ලැබී ඇත. | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීමට, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට රාජ්‍ය ආයතන එක්ව කටයුතු කරන වැඩපිළවෙලක් සැකසිය යුතුය. |
| (ඉ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව ඩොලර් මිලියන 5 ඉක්මවන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජය සහ අරමුදල් සපයන ආයතනය අතර, ලිඛිත ගිවිසුමක් තිබිය | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 හි මහා මාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර ඇමරිකානු ඩොලර් | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීමට, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට රාජ්‍ය ආයතන එක්ව කටයුතු කරන |

| | | | |
|---|---|---|---|
| | යුතු වුවත්, එවැනි ගිවිසමුක් නොමැතිව මධ්‍යම අධිවේගී මාර්ගය - IV කොටස සඳහා කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවා තිබුණි. තවද ව්‍යාපෘතියට අරමුදල් සපයන්නකු හා අරමුදල් සැපයීම පිළිබඳ එකඟතාවයක් නොමැතිව වර්ෂ පහකට ආසන්න කාලයක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය සඳහා රු.මිලියන 353 ක් වියදම් කර තිබුණි. එසේම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කට රු. මිලියන 6 ක දිරි දීමනා ගෙවා තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ඉතා මන්දගාමීව සිදු වෙමින් පැවතුණි. | මිලියන 5 ඉක්මවන ව්‍යාපෘති සඳහා ලිඛිත ගිවිසුමක් එළඹිය යුතු බවට විශේෂ සඳහනක් කර නොමැත.<br><br>කොන්ත්‍රාත් ආයතනය මගින් මූල්‍ය පහසුකම් අදාල චීනයේ EXIM බැංකුව මගින් සැපයීමට ප්‍රමාද කිරීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.ඉන් පසුව 2020 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැවතත් තනි පුද්ගල ආයෝජකයෙකු වෙතින් තාක්ෂණික හා මූල්‍යමය යෝජනා කැඳවීමට තීරණය වූ බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.<br><br>දිරි දීමනා ගෙවීමේ ක්‍රමවේදය සම්පූර්ණ කිරීමේදී අදාල කාලය ඉක්මවා ගියද ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ අරමුණින් අදාල දිරි දීමනා ගෙවීමට කටයුතු කර ඇත. | වැඩපිළවෙලක් සැකසිය යුතුය. |
| (ඊ) | මාර්ග සංවර්ධන අධිකාරිය සතු ධාරණ අගය රු.මිලියන 992,176 ක් වූ සමස්ථ වත්කම් වලින් සියයට 76 ක් වූ රු.මිලියන 754,747 ක් දේපළ, පිරියත හා උපකරණ වටිනාකම නියෝජනය කරයි. නමුත් අධිකාරියේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සහ ඒ සඳහා යොදවා ඇති මානව සහ භෞතික සම්පත් සැලකිය යුතු මට්ටමක නොවීය. | ස්ථාවර වත්කම් කළමණාකරන පාලන ක්‍රමවේදයක් ලෙස නව පරිසනක ගත පැකේජයක් හඳුන්වා දීමටත් මානව හා භෞතික සම්පත් අවශ්‍ය ප්‍රමාණයට වැඩි කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අධිකාරියේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සහ ඒ සඳහා ප්‍රමාණවත් මානව සහ භෞතික සම්පත් ප්‍රමාණයක වෙන් කිරීම. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන මාර්ග රක්ෂිත විවිධ ආර්ථික කටයුතු සඳහා බාහිර පාර්ශව වෙත බදු දී තිබුණි. එම ඉඩම් බදුකරුවන් විසින් ගිවිසුම්ගත කාර්යයන්ගෙන් පරිබාහිර කටයුතු සඳහා භාවිතා කර තිබුණද අධිකාරිය ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අක්කර 11 රූඩ් 02 පර්චස් 38.3 ක් වූ රු.මිලියන 123 ක් වටිනා අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ඉඩම | මෙම ඉඩමේ අනවසර පදිංචි කරුවන් පදිංචි වී සිටින බිම් ප්‍රමාණය හැර ඉතිරිකොටස වටා මායිම් තාප්පයක් ඉදිකිරීමේ කටයුතු සියයට 90 කින් අවසන් වී ඇත. | අධිකාරියේ වත්කම් සම්බන්ධයෙන් නිසි ආරක්ෂක වැඩපිළිවෙලක් විධායක ඉංජිනේරු කාර්යාල හරහා ක්‍රියාත්මක කිරීමට සහ වත්කම් මිලදී ගත් අපේක්ෂිත කාර්යයට යෙදවීමට කටයුතු කළ යුතුය. |

වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජර්මානු කාර්මික විද්‍යාලය විසින් භුක්ති විඳින අතර ඉතිරි බිම් කොටස් වල අනවසර පුද්ගලයින් පදිංචිව තිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කිලෝ මීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,743 ක් වූ ව්‍යාපෘති 61 ක ඇස්තමේන්තු වල සඳහන් වැඩ අයිතම 34 ක් මහා මාර්ග සඳහා වූ සම්මත අනුපාතයන්හි සඳහන් මිල රේටයන්ට වඩා වැඩියෙන් ඇස්තමේන්තු කිරීම, අසාමාන්‍ය ප්‍රමාණයකින් අපතයන් ඇස්තමේන්තු කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහන වියදම් අධි ඇස්තමේන්තු කිරීම සහ අවශ්‍යතාවය ඉක්මවා වියදම් ඇස්තමේන්තු කිරීම යන හේතූන් නිසා පරීක්ෂා කරන ලද මාර්ග ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 212.2 කින් අධිගණනය වී තිබුණි. එසේම, මාර්ග වල මුළු දුර කිලෝ මීටර් 16.27 ක් සහ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 278.29 ක් වූ මාර්ග 9 ක ABC ඇතිරීම නියමිත ප්‍රමිතියට සිදු කර නොතිබුණි. මෙකී තත්ත්වය මාර්ගයේ කල් පැවැත්මට ඍජුවම බලපාන අතර නිසි ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ද සිදු කර තිබුණි. | 2019 HSR මිල ගනන් අනුව සැකසූ ඇස්තමේන්තු පසුව සංශෝධනය කර ඇත. නැවත ප්‍රවාහනය භූවිශමතා කාලගුණ තත්ත්වය සැලකිල්ලට ගෙන අපතය සියයට10 ලෙස ඇස්තමේන්තු කළද පසුව තත්ත්වය පරීක්ෂා කර සියයට 5 දක්වා අඩු කර ඇස්තමේන්තු සංශෝධනය කර ඇත. අධිකාරියේ බලපත්‍ර සහිත අමුද්‍රව්‍ය සැපයුම් ස්ථාන මත පදනම්ව ඇස්තමේන්තු සකසා තිබුණද පසුව ඊට වඩා ලාභදායී ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා ගත හැකි නව ස්ථාන සැලකිල්ලට ගන්නා ලෙස උපදෙස් දී ඇත. | මහාමාර්ග නොවන මාර්ග සඳහා සුදුසු පිරිවිතරයක් සකස් කිරීමට හා ඉදිකිරීම් සම්බන්ධ අධිකාරියේ අධීක්ෂණය විධිමත් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මාර්ග සංවර්ධන ඇස්තමේන්තු තුළ අන්තර්ගත වූ නමුත් භෞතික පරීක්ෂා වලදී ඉටු කර නොතිබූ වැඩ අයිතම් වල ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.මිලියන 74 ක් සඳහාද ගෙවීම් කර තිබුණි. එකවර මුදල් ගෙවන ක්‍රමය යටතේ ඉටුකළ යුතු වැඩ, ව්‍යාපෘති නාම පුවරු සවි කිරීම, රථ වාහන පාලනය සහ වැඩ බිම් රක්ෂණය සිදු නොකිරීම සහ ඇස්තමේන්තුවල සඳහන් වැඩ ඉටු නොකිරීමට නියෝග ලැබීම වැනි කරුණු මේ තුල අන්තර්ගත විය. | මෙහි සඳහන් වැඩ අයිතමයන් ඉටුකර අවසන් වූ පසු පමණක් ගෙවීම් කරනු ලැබේ. | හැකිතාක් යථාර්තවාදී ව ඇස්තමේන්තු කිරීමේ කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | මෑතකදී සංවර්ධනය කර භාවිතයට ප්‍රමාණාත්මක සුදුසු තත්ත්වයෙන් තිබූ කිලෝ මීටර් 50.58 ක් නැවත සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 923.91 ක් කිලෝ මීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නැවත ඇස්තමේන්තු කර පුනරුත්ථාපනය කර තිබුණි. | අදාල පලාත් පාලන ආයතන සම්බන්ධීකරණය කර ගැනීම තුලින් සංවර්ධනය කළ යුතු මාර්ග හඳුනාගන්නා අතර සංවර්ධනය කළ යුතු ආකාරය අධිකාරියේ ඉංජිනේරුවන් විසින් තීරණය කරණු ලැබේ. මෙම මාර්ග සංවර්ධනය කිරීමෙන් පසු | සංවර්ධනය සඳහා මාර්ග තෝරා ගැනීමේදී වඩාත් ප්‍රමුඛතාවය දිය යුතු මාර්ගම ඒ සඳහා තෝගෙන හිඟ සම්පත් කළමණාකරණය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාල ආයතන වෙත භාරදෙන අතර ඒවා නඩත්තුවට අධිකාරියේ සහය ලබා දිය හැක. | |
| (ඇ) | පෞද්ගලික කොන්ත්‍රාත් සමාගම් කිහිපයක් වෙත වර්ෂ 2013 දී ප්‍රදානය කර තිබූ රු.මිලියන 103.49 ක මාර්ග සහ පාලම් ඉදිකිරීමේ කොන්ත්‍රාත් වැඩවල දුර්වල ප්‍රගතිය මත එම කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබූ අතර, මෙයින් මාර්ග ඉදිකිරීම් අධිකාරියේ ඍජු ශ්‍රමය මත ඉදිකිරීම් වැඩ නිමකර තිබුණි. තවද, මෙම කොන්ත්‍රාත් සඳහා ලබා දී තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.මිලියන 7.58 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුවන් අත රැඳී තිබුණි. තවද, තවත් පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් වෙත 2012 වර්ෂයේ ප්‍රදානය කර තිබූ රු.මිලියන 25.7 ක කොන්ත්‍රාත් 03 ක් සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබීම හා ලබා දී තිබූ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළ කොන්ත්‍රාත් වැඩ සම්පූර්ණ නොකර අතරමඟ නතර කර තිබීම හේතුවෙන් අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 2.1 ක් විය. | මේ සඳහා වූ බේරුම්කරණ ක්‍රියාවලිය අතරමඟ නවතා ඇති අතර කොන්ත්‍රාත්කරුවන් සමඟ 2019, 2020 වර්ෂ තුළ ගිවිසුම් වලට එළඹ නැත. කාලය ඉක්මයාම මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති නොහැකියාව නිසා ඒ සඳහා වෙන් කිරීමක් සිදු කර ඇත. මේ සම්බන්ධව වැඩි දුර උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙත යොමු කිරීමට තීරණය කර ඇත. | කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යය නිමකිරීමට ඇති හැකියාව මනාව හඳුනාගත යුතු අතර අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත්කරුගෙන් කාර්යය නිම කරගත යුතු වේ.එමෙන්ම අපේක්ෂිත ප්‍රගතියක් නොමැති කොන්ත්‍රාත්කරුවන්ට නැවත කොන්ත්‍රාත් ප්‍රදානය නොකල යුතු අතර පවතින නීති ඒ සඳහා ප්‍රමාණවත් නොවේ නම් ඒ සඳහා නොපමාව කටයුතු කල යුතුය. |

### 3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරියේ මුලස්ථාන ගොඩනැගිල්ලෙන් සියයට 28.7 ක් වූ වර්ග අඩි 72,400 ක් මහා මාර්ග අමාත්‍යාංශය විසින් භාවිතා කරන නමුත් ඒ සඳහා බදු කුලියක් අයකර නොතිබුණි. තවද, සෙත්සිරිපාය ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 8,290ක් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යාල පවත්වාගෙන යෑම වෙනුවෙන් භාවිතා කර ඒ සඳහා 2020 වර්ෂයේ දී රු.මිලියන 11.49 ක කුලියක් අධිකාරියට ගෙවීමට සිදු වී තිබුණි. | මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ තීරණය දැනුම් දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නිසා කුලී ගෙවිය නොහැකි බව දැනුම් දී ඇත. රේඛීය අමාත්‍යාංශය භාවිතා කරන අනෙකුත් වත්කම් සමඟම මෙම ගොඩනැගිලි කොටසද භාර දීමට කටයුතු කරමින් පවතී. එකම පරිශ්‍රය තුල අමාත්‍යාංශය හා අධිකාරිය පිහිටා තිබීම කාර්යාල කටයුතු සඳහා පහසු වේ . මෙම ගොඩනැගිල්ල තුල අධිකාරියේ සියළුම කාර්යාල සඳහා ඉඩ පහසු කම් නොමැති බැවින් කුලී පදනම මත භාහිර පරිශ්‍රයන් ලබා ගෙන ඇත. | වත්කම හා බැදි අවදානම හා ප්‍රතිලාභය ලබන පාර්ශ්වය සැලකිල්ලට ගෙන වත්කම හඳුනාගැනීමට ක්‍රියාකල යුතුය.වත්කම හා ආනුශංගිකව බැදි වියදම් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට ක්‍රියාකල යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 28 ක පුරප්පාඩු පැවති අතර, මෙකී තනතුරු වල පුරප්පාඩු පැවතීම කළමනාකරණ කටයුතු වලට මෙන්ම අධිකාරියේ කාර්යසාධනය කෙරෙහි ද සෘජුවම බලපා තිබුණි. තවද, එදිනට නිලධාරීන් 958 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවති අතර 2020 වර්ෂයේ සේවක වැටුප් වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු.මිලියන 10,287 ක් වී තිබුණි. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබූ ප්‍රදාන වල වටිනාකම රු.මිලියන 7,399.5 කි. අතිරික්ත සේවක සංඛ්‍යාව වූ සේවකයන් ද ඇතුළුව සමස්ථ සේවක මණ්ඩලය වෙනුවෙන් වැටුප් ගෙවීම වෙනුවෙන් අමතර රු.මිලියන 2,887.5 ක් අධිකාරියේ අරමුදල් වලින් ගෙවා තිබුණි. | මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කටයුතු ප්‍රසාරණය වීම නිසා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවාගෙන ඇත. සමාලෝචිත වර්ෂය වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව අඩු වී ඇත. වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වැටුප් ගෙවීම සඳහා අධිකාරියේ අරමුදල් භාවිත කර ඇත. | අධිකාරියේ කටයුතු පුළුල් වීමට සාපේක්ෂව කාර්යමණ්ඩලය ඒ අනුව අනුමත කරවා ගැනීම හා තාක්ෂණය භාවිතය සුලබ කිරීමට කටයුතු කළ යුතුය. |